# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1816/33 - 2013 ජුනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ හා සැදීමේ කර්මාන්තයේ නියුතු සේවකයින්ට ගෙවිය යුතු විශේෂ දීමනා**

ඉහත සඳහන් කර්මාන්තය සඳහා 2013 ජුනි මස ජීවන වියදම් අංකය 176.5 වන නිසා 2013 ජූලි මාසයේ සාමාන්‍ය වැඩ කරන දිනයක් වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ දීමනා පහත දැක්වෙන ආකාරයට බැව් පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරිය) 20 (2)(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ හා සැදීමේ කාර්මාන්තය

| *සේවා පන්තිය* | *සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනා* |
|---|---|
| **දෛනික වැටුප් ලබන්නෝ :** | *රු. ශත* |
| කම්කරුවෙකුට (පිරිමි/ගැහැණු) | 542.83 |

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 ජුනි මස 28 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

07-742/1

1A - G 17938— 315 (2013/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එල්. ඩී. බී. 80/34

**පඩි පාලක සහා ආඥාපනත නිවේදනයයි**

පඩි පාලක සහා ආඥාපනතේ (136 පරිච්ඡේදයේ) 20(2)ඩී යන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් මස 03 වැනි දින අංක 9327, වර්ෂ 1949 අප්‍රේල් මස 01 වැනි දින අංක 9963, වර්ෂ 1953 ජුනි මස 25 වැනි දින අංක 10541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 11568, වර්ෂ 1962 ජුනි මස 22 වැනි දින අංක 13179 යන *ගැසට් පත්‍රයන්හි* පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධාරියා ලෙස පත් කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තැන්පත් දොන් චන්ද්‍රසිරි අබේරත්න ගුණවර්ධන වන මම මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයන් කෙරෙහි වර්ෂ 2013 ජුනි මාසය තුළ අදාළ කළ හැකි ජීවන වියදම් දර්ශකාංකය (2006/07 පදනම් වූ) 176.5 වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඩී. සී. ඒ. ගුණවර්ධන,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්.

2013 ජුනි මස 28 වැනි දින,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 563,
කොළඹ.

උපලේඛනය

1. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සැදීමේ ව්‍යාපාරය.

07-742/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.